SLGURU.LK

# කලාප අධ්‍යාපන කාර්යාලය කොළඹ - ශ්‍රී ජයවර්ධනපුර
# வலயக் கல்வி காரியாலயம் கொழும்பு - ஸ்ரீ ஜயவர்தனபுரம்
# Zonal Education Office Colombo - Sri Jayawardhanapura

දෙවන වාර පරීක්ෂණය - 2025

இரண்டாம் தவணைப் பரீட்சை - 2025

Second Term Test - 2025

10 ශ්‍රේණිය | බුද්ධ ධර්මය | කාලය පැය 01යි

1 කොටස

**01 සිට 40 දක්වා ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

(01) සිදුහත් බෝසතාණන් දැක නිබ්බුත පද කියනු ලැබුවේ කවුරුන් විසින්ද?

(i) කිසාගෝතමිය විසිනි. (ii) ප්‍රජාපතිගෝතමිය විසිනි.

(iii) යසෝදරාව විසිනි. (iv) මාගන්දියා විසිනි.

(02) බුදු ගුණ නවයෙන් එකක් වන්නේ මෙයින් කුමක්ද?

(i) සන්දිට්ඨිකෝ (ii) අකාලිකෝ

(iii)ලෝකවිදූ (iv) ආහුනෙයියෝ

(03) "රහසත් පව් නොකොට..." කවිය ඇතුළත් ග්‍රන්ථය වන්නේ,

(i) සුභාෂිතය (ii) බුදුගුණ අලංකාරය

(iii) ලෝවැඩසඟරාව (iv) ගුත්තිල කාව්‍ය

(04) මහා සංඝරත්නය මනා වූ පිළිවෙත් පුරණ බැවින් මේ නමින් හඳුන්වනු ලබයි.

(i) උජුපටිපන්න (ii) සුපටිපන්න

(iii) ඤායපටිපන්න (iv) සාමීචිපටිපන්න

(05) භාවනාව සඳහා යොමුවීමේදී පුද්ගලයා තුළ තිබිය යුතු ගුණාංගයක් නොවන්නේ,

(i) ඉන්ද්‍රිය සංවරයයි. (ii) සති සම්පජඤ්ඤයයි.

(iii)සන්තුට්ඨිතාවයි. (iv) විකාල භෝජනාවයි.

(06) සිත අපිරිසිදු කරන අකුසල මූල වන්නේ,

(i) ලෝභ, ද්වේශ, මෝහ (ii) දාන, සීල, භාවනා

(iii)වේදනා, සංඥා, සංඛාර (iv) සීල, සමාධි, ප්‍රඥා

(07) ජේතවනාරාමය පූජා කළේ කවුරුන් විසින්ද?

(i) අජාසත්ත රජතුමා විසිනි. (ii) බිම්බිසාර රජතුමා විසිනි.

(iii)අනේපිඩු සිටුතුමා විසිනි. (iv) කොසොල් රජතුමා විසිනි.

(08) "විසේසේන පස්සතීති විපස්සනා" යනුවෙන් හඳුන්වන භාවනාව වනුයේ,

(i) සමාධි භාවනාවයි. (ii) චිත්ත භාවනාවයි.

(iii)සමථ භාවනාවයි. (iv) විපස්සනා භාවනාවයි.

(09) දිගු කලක් නැවත නැවත කිරීමෙන් ප්‍රබලත්වයට පත්වන චේතනා පෙරටු කරගත් ක්‍රියාව හෙවත් කුසල අකුසල කර්ම ධර්මයේ හැඳින්වෙන්නේ කුමන නමකින්ද?

(i) වේදනා (ii) සඤ්ඤා

(iii)විඤ්ඤාණ (iv) සංඛාර



SLGURU.LK
Education Purpose Only

SLGURU.LK

(10) වැලිවිට ශ්‍රී සරණංකර නා හිමියන්ට සංඝරාජ පදවිය පිරිනැමුවේ,

(i) ශ්‍රී විජය රාජසිංහ රජතුමා ය. (ii) කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා ය.

(iii) ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා ය. (iv) රාජාධිරාජසිංහ රජතුමා ය.

(11) සිගාලෝවාද සූත්‍රයේ සඳහන් වන භෝග විනාශ මුඛ ගණන වන්නේ,

(i) 4 කි. (ii) 12 කි. (iii) 6කි. (iv) 16 කි.

(12) මරණාසන්න මොහොතේ ඌරෙකු මෙන් කෑ ගසා අපායගාමී වූ තැනැත්තා වනුයේ,

(i) සුභ මානවකයා ය. (ii) සුප්පිය පිරිවැජියා ය.

(iii) චුන්දසූකර ය. (iv) සංජය පිරිවැජියා ය.

(13) "උට්ඨානවතෝ" යන වචනයේ අදහසට අයත් නොවන්නේ,

(i) අලස බව (ii) උත්සාහවන්ත බව

(iii) නොපසුබස්නා වීර්ය (iv) කාර්යක්ෂමව ක්‍රියා කිරීම.

(14) "ධම්ම ජීවී" යන්නට නොගැළපෙන කරුණ වන්නේ,

(i) සම්මා ආජීව ය. (ii) නොකළයුතු වෙළඳාම් කිරීම.

(iii) මිත්‍යා දිවි පැවැත්මෙන් තොරවීම. (iv) දැහැමිව ජීවත් වීම.

(15) සිගාලෝවාද සූත්‍රයට අනුව 'තම මිත්‍ර වර්ගයාට හඳුන්වාදීම' කුමන පාර්ශවය විසින් ඉටු කළ යුතු යුතුකමක් ද?

(i) දෙමාපියන්ගේ වගකීමකි. (ii) ගුරුවරයාගේ වගකීමකි.

(iii) මිත්‍රයන්ගේ වගකීමකි. (iv) පූජ්‍ය පක්ෂයේ වගකීමකි.

(16) සදාචාර සම්පන්න, යහපත් සමාජ සබඳතා සහිත ජීවිතයක් ගත කිරීමට උපදෙස් සපයන සූත්‍ර දේශනාව වන්නේ,

(i) සිගාලෝවාද සූත්‍රයයි. (ii) පරාභව සූත්‍රයයි.

(iii) කාලාම සූත්‍රයයි. (iv) මංගල සූත්‍රයයි.

(17) සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන පරිදි සැමියා විසින් තම බිරිඳට කළයුතු යුතුකම් අතරට අයත් නොවන කරුණක් වන්නේ මින් කුමක් දැයි තෝරන්න.

(i) ගරු කිරීම. (ii) උපයන ධනය ආරක්ෂා කිරීම.

(iii) අවමන් නොකිරීම. (iv) ඇඳුම් පැළඳුම් සපයා දීම.

(18) අද බහුලව දක්නට ලැබෙන උද්ඝෝෂණ, වැඩවර්ජන ආදියට හේතු වී ඇත්තේ මින් කුමන පාර්ශවයක යුතුකම් ඉටු නොවීම ද?

(i) මිතුරන්ගේ යුතුකම්. (ii) සේවකයාගේ යුතුකම්.

(iii) සේව්‍යයාගේ යුතුකම්. (iv) දෙමාපියන්ගේ යුතුකම්.

(19) බුදුරජාණන් වහන්සේ විසින් තමන් වහන්සේ දෙවියෙක්, ගාන්ධර්වයෙක්, යක්ෂයෙක්,මනුෂ්‍යයෙක් නොවන බවත්, බුද්ධ නම්වන බවත් දේශනා කරනු ලැබුයේ,

(i) භාරද්වාජ බමුණාට ය. (ii) හුහුංක බමුණාට ය.

(iii) සොත්ථිය බමුණාට ය. (iv) ද්‍රෝණ බමුණාට ය.

(20) "වෛර කරන මිනිසුන් අතර අවෛරීව සුවසේ වාසය කරමු " යන අදහස ඇතුළත් ධම්මපද ගාථාවේ මුල් පදය වන්නේ,

(i) "සුසුඛං වත ජීවාම..." (ii) "වේරේන වේරානි..."

(iii) "අත්තනාව කතං පාපං..." (iv) "සාරංච සාරතෝ ඤත්වා..."



SLGURU.LK
Education Purpose Only

SLGURU.LK

(21) බෞද්ධයන් වශයෙන් අප රාගා දී කෙලෙස්වලින් දූෂිත වූ ලෝකයේම ඇලී ගැලී සිටීම,

(i) අඳුරෙන් අඳුරට යාමකි. (ii) අඳුරෙන් ආලෝකයට යාමකි.

(iii) ආලෝකයෙන් අඳුරට යාමකි. (iv) ආලෝකයෙන් ආලෝකයට යාමකි.

(22) සිව්සඟරාවත්වලින් එකකි,

(i) කීකරුකම (ii) මෙත්තා

(iii) ප්‍රිය වචනය (iv) කරුණාව

(23) බුදු දහම තුළ පරිසරය සුරකීමේ අගය පැහැදිලි වන අවස්ථාවක් වන්නේ,

(i) ජලය පෙරා පානය කිරීම. (ii) මල්, පළතුරු උයන් වැවීම.

(iii) අනිමිසලෝචන පූජාව. (iv) වෘක්ෂලතා සෙවනේ ධර්මය දේශනාව.

(24) අත්තූපනායික ධර්ම පර්යාය යනු,

(i) අනුන්ගේ දුකේදී පිහිට වීම. (ii) අන් අයගේ දියුණුව දැක ඊර්ෂ්‍යා නොකිරීම.

(iii) තමා උපමා කොට අනුන්ට හිංසා නොකිරීම. (iv) සතුන්ට හිංසා නොකිරීම.

(25) බුදුන් වහන්සේ දුෂ්කර ක්‍රියාව අතහැර අනුගමනය කළ පිළිවෙත වන්නේ,

(i) මැදුම් පිළිවෙත (ii) කාමසුඛල්ලිකානුයෝගය

(iii) අත්තකිලමථානුයෝගය (iv) කර්මවාදය

(26) "සමවායෝ එව සාධු" යන්නෙහි අර්ථය වන්නේ,

(i) සමගිය යහපතකි. (ii) වාද කිරීම යහපතකි.

(iii) පරුෂ වචන කීම යහපතකි. (iv) අඩදබර කිරීම යහපතකි.

(27) මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා යනු,

(i) සිව්සඟරාවතයි. (ii) සිව්බඹ විහරණයි.

(iii) සිව් පසයයි. (iv) සතර සංග්‍රහ වස්තුවයි.

(28) අතීතයේ දී ශ්‍රී ලාංකික බෞද්ධයාගේ ආර්ථිකය ස්වයංපෝෂිත වූයේ,

(i) වෙළඳාමෙනි. (ii) අඩියම් කිරීමෙනි.

(iii) කෘෂි කර්මාන්තයෙනි. (iv) සතුන් ඇතිකිරීමෙනි.

(29) කර්මය යනුවෙන් අදහස් වන්නේ,

(i) මානසික, වාචසික ක්‍රියාවයි. (ii) යහපත් අයහපත් ක්‍රියාවයි.

(iii) වාචසික, කායික ක්‍රියාවයි. (iv) සිතාමතා කරනු ලබන ක්‍රියාවයි.

(30) බෞද්ධ ඉගැන්වීමට අනුව භාවනා කිරීම සඳහා යොදා ගැනීමට සුදුසු ඉරියව් ගණන,

(i) 3 කි. (ii) 4 කි. (iii) 5 කි. (iv) 2 කි.

(31) සිතින් සිදු කරන අකුසල කර්මයක් නොවන්නේ,

(i) අභිධ්‍යාව (ii) ව්‍යාපාදය

(iii) මිත්‍යාදෘෂ්ටිය (iv) මුසාවාදය

(32) කර්මය පිළිබඳ බෞද්ධ විග්‍රහයට අනුව සංසාරික ජීවිතයේ කවර අවස්ථාවක හෝ විපාක ලබාදෙන කර්මය හැඳින්වෙන්නේ,

(i) දිට්ඨධම්මවේදනීය කර්ම ලෙස ය. (ii) උපපජ්ජවේදනීය කර්ම ලෙස ය.

(iii) අපරාපරියවේදනීය කර්ම ලෙස ය. (iv) අහෝසි කර්ම ලෙස ය.



SLGURU.LK
Education Purpose Only

SLGURU.LK

(33) සතර සංග්‍රහ වස්තුවල එන අර්ථචර්යා යන්නෙහි අදහස වන්නේ,

(i) ආර්ථික දියුණුවයි. (ii) අනුන්ගේ දියුණුවට උදව් කිරීමයි.

(iii)දෙලොව දියුණුවයි. (iv) තම දියුණුව සලසා ගැනීමයි.

(34) "මාගේ මේ ව්‍යායාමය රජසැප පිණිස නොව; සම්බුද්ධ ශාසනයේ චිර පැවැත්ම සඳහායි" මෙම ප්‍රකාශය කළ රජතුමා වන්නේ,

(i) කොසොල් රජතුමා (ii) දුටුගැමුණු රජතුමා

(iii)බිම්බිසාර රජතුමා (iv) මහසෙන් රජතුමා

(35) "අනිච්චාවත සංඛාරා - උප්පාද වයධම්මිනෝ" යන ගාථාව ඇතුළත් සූත්‍රය වන්නේ,

(i) පරාභව සූත්‍රයයි. (ii) පරිනිබ්බාන සූත්‍රයයි.

(iii)කරණීයමෙත්ත සූත්‍රයයි. (iv) රතන සූත්‍රයයි.

(36) පංචස්කන්ධය යනු,

(i) රූප, වේදනා, සඤ්ඤා, උපාදාන, විඤ්ඤාණ (ii) රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ

(iii)රූප, වේදනා, උපාදාන, භව, සංඛාර (iv) රූප, වේදනා, සඤ්ඤා, විඤ්ඤාණ, නාම රූප

(37) මරණාසන්න මොහොතේ බුදුරදුන් දැක පහදවා ගත් සිතෙහි ප්‍රතිඵලයක් ලෙස දෙව්ලොව උපත ලද්දේ,

(i) ඡත්ත මානවක කුමරු ය. (ii) මඝ මානවක කුමරු ය.

(iii)මට්ටකුණ්ඩලී කුමරු ය. (iv) හත්ථාලක කුමරු ය.

(38) අවසන් මොහොතේ සිතට නැගුණු අකුසල සිතුවිල්ලක් නිසා දුගතිගාමී වූයේ,

(i) උප්පලවන්නාවයි. (ii) කෝසල මල්ලිකාවයි.

(iii)මාගන්දියා බැමිණියයි. (iv) ඛේමා බිසවයි.

(39) උපතිස්ස පිරිවැජියා පළමුව පැවිදි වී සිටියේ කුමන ගුරුවරයා සමීපයේද?

(i) සංජය පිරිවැජියා ළඟ ය. (ii) බුදුරජාණන් වහන්සේ ළඟ ය

(iii)දෙව්දත් තෙරුන් ළඟ ය. (iv) දිසාපාමොක් ගුරුතුමා ළඟ ය.

(40) "යේ ධම්මා හේතුප්පභවා" ගාථාව දේශනා කලේ කවුරුන් විසින්ද?

(i) වප්ප තෙරුන් විසිනි. (ii) කොණ්ඩඤ්ඤ තෙරුන් විසිනි.

(iii)අස්සජි තෙරුන් විසිනි. (iv) මහානාම තෙරුන් විසිනි.

(ලකුණු 1*40=40)

***



SLGURU.LK
Education Purpose Only

SLGURU.LK

# කලාප අධ්‍යාපන කාර්යාලය කොළඹ - ශ්‍රී ජයවර්ධනපුර
# வலயக் கல்வி காரியாலயம் கொழும்பு - ஸ்ரீ ஜயவர்தனபுரம்
# Zonal Education Office Colombo - Sri Jayawardhanapura

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**இரண்டாம் தவணைப் பரீட்சை - 2025**
**Second Term Test - 2025**

**10 ශ්‍රේණිය** | **බුද්ධ ධර්මය** | **කාලය පැය 02යි**

**11 කොටස**

**පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 04කට පිළිතුරු සපයන්න.**

(01)

i) සිදුහත් කුමරා උගත් ශිල්ප ශාස්ත්‍ර 02ක් නම් කරන්න.

ii) ''රාහුලෝ ජාතෝ බන්ධනං ජාතං'' යන්නෙහි අර්ථය දක්වන්න.

iii) ''ආරභථ නික්ඛමථ - යුඤ්ජථ බුද්ධ සාසනේ'' යන ගාථාව අයත් සූත්‍රය නම් කරන්න.

iv) බෞද්ධයෝ උපතේ සිට මරණය දක්වා කාලය තුල සංඝ රත්නයේ ආශිර්වාදය ලබා ගන්නා විශේෂ අවස්ථාවන් 02ක් නම් කරන්න.

v) භික්ෂූන් වහන්සේ සැදැහැවතුන්ගෙන් ප්‍රත්‍ය පහසුකම් ලබාගත යුත්තේ කෙසේද?

vi) ධර්ම රත්නයේ ගුණ අනුව 'තමා විසින් ම පිළිපැද ඇස් පනාපිට මෙලොවදීම ප්‍රතිඵල දැකගත හැකි බැවින්'' ධර්ම රත්නය මේ නමින් හඳුන්වනු ලබයි.

vii) සමථ භාවනාව හඳුන්වනු ලබන වෙනත් නම් 02ක් ලියා දක්වන්න.

viii) පුද්ගල චරිත අනුව භාවනාව වඩන පුද්ගලයාට ලබාදෙන කමටහන් ගණන කීයද?

ix) ලෝකය හා ජීවිතය පිළිබඳ ඇතිකර ගත හැකි අවබෝධයේ දෙයාකාරය නම් කරන්න.

x) වැලිවිට අසරණසරණ සිරි සරණංකර සංඝරාජ මාහිමිපාණන් වහන්සේ පිහිටුවා ගනු ලැබූ සංවිධානය කුමක්ද?

(ලකුණු 2*10=20)

(02)

(i) ''අචරිත්වා බ්‍රහ්ම චරියං

..........................................

..........................................

පුරාණානි අනුත්ථුනං'' යන ගාථාවේ මැද පද දෙක සම්පූරණ කරන්න. (ලකුණු 02)

(ii) ඉහත (i) හි සඳහන් ගාථාවේ අර්ථය ලියන්න. (ලකුණු 03)

(iii) බුදුන් වහන්සේ විසින් දේශිත ධම්ම පදය බෞද්ධ දරුවකු වශයෙන් තමාගේ ජීවිත සාර්ථකත්වයට යොදා ගත හැකි ආකාරය උදාහරණ සහිතව පහදන්න. (ලකුණු 05)



SLGURU.LK
Education Purpose Only

SLGURU.LK

(03)

(i) බුදු දහමට අනුව 'කළයුතු දේ' සහ 'නොකළයුත් දේ' හඳුන්වන නම් වෙන වෙන ම ලියන්න. (ලකුණු 02)

(ii) සිගාලෝවාද සූත්‍රයේ සඳහන් වන භෝග විනාශ මුඛ නම් කරන්න. (ලකුණු 03)

(iii) සිල් රැකීමේ ආනිසංස මගින් පරිහානිය වළක්වා ගනිමින් පුද්ගල සංවර්ධනය ඇතිකර ගත හැකි ආකාරය විමසන්න. (ලකුණු 05)

(04)

(i) සිගාලෝවාද සූත්‍රය දේශනා කරනු ලැබුවේ කා හටද? (ලකුණු 02)

(ii) බුදු දහමෙහි මව්පියන් හඳුන්වනු ලබන වෙනත් නම් 03ක් ලියා දක්වන්න. (ලකුණු 03)

(iii) යුතුකම් ඉටු නොකිරීමෙන් පුද්ගල දියුණුව මෙන්ම සමාජ දියුණුව ද බිඳවැටෙන ආකාරය එක් සමාජ කණ්ඩායමක් නිදසුනක් ලෙස ගෙන සිගාලෝවාද සූත්‍රය ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(05)

(i) බුද්ධ කාලීන භාරතයේ ජීවත් වූ, මිනිසුන්ගේ අංග ලක්ෂණ බලා ඔවුන් හඳුනාගත හැකි ශාස්ත්‍රය දැන සිටි බමුණා කවුරුන්ද? (ලකුණු 02)

(ii) පද්මාකාර ජීවිතය උපමා කර ගිමින් පෞරුෂ ලක්ෂණ අනුව පුද්ගලයන් වර්ග කරන ආකාර තුන නම් කරන්න. (ලකුණු 03)

(iii) ශිෂ්‍යයෙකු වශයෙන් ඔබ ද පද්මාකාර ජීවිතයක් ගතකළ යුත්තේ කෙසේ දැයි පහදන්න. (ලකුණු 05)

(06)

(i) තිදොරින් කරන කර්මයේ දෙයාකාරය නම් කරන්න. (ලකුණු 02)

(ii) අකුසල මූල 03 ලියා දක්වන්න. (ලකුණු 03)

(iii) දස කුසල කර්ම අනුගමනය කිරීමෙන් සමාජය යහපත් වන ආකාරය පහදන්න. (ලකුණු 05)

(07) පහත සඳහන් මාතෘකාවලින් දෙකකට පමණක් කෙටි සටහන් ලියන්න. (ලකුණු 2*5=10)

(i) වැලිවිට අසරණ සරණ සිරි සරණංකර මාහිමිපාණන් වහන්සේ

(ii) සහජීවනය

(iii) ත්‍රිලක්ෂණය

(iv) උපධි සම්පත්තිය

***



SLGURU.LK
Education Purpose Only